# 03 ශ්‍රී ලංකාවේ ජාතික පුනරුදය

## හැඳින්වීම

1848 වර්ෂයේ පැවති සටන නිම වීමෙන් පසු ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස දිනා ගැනීමට කටයුතු කළ අවධිය, ආගමික හා ජාතික පුනරුද සමය වශයෙනුත් දේශපාලන උද්ඝෝෂණ පැවති සමය වශයෙනුත් කාල පරිච්ඡේද දෙකකට අයත් වේ.

1850 වර්ෂයෙන් පසුව 1915 පමණ වන තෙක් ආගමික හා ජාතික පුනරුද ව්‍යාපාරයේ කටයුතුවලට ප්‍රමුඛත්වය ලැබුණි. 1915 සිට 1948 දක්වා දේශපාලන උද්ඝෝෂණවලට මූලිකත්වය හිමි විය.

1815 වර්ෂයේ දී උඩරට රාජධානිය බ්‍රිතාන්‍යයන්ට යටත් වීමෙන් පසුව මෙරට සාම්ප්‍රදායික ආගම් හා සංස්කෘතියේ පැවැත්මට බාධා එල්ල විය. මේ නිසා 19 වන සියවසේ අග භාගයේ දී මෙරට බෞද්ධ, හින්දු හා ඉස්ලාම් ජනතාව තුළ ආගමික හා ජාතික වශයෙන් මහත් ප්‍රබෝධයක් ඇති විය. එම තත්ත්වය ජාතික පුනරුදය වශයෙන් මෙම පාඩමේ දී විස්තර කෙරේ.

## 3.1 ජාතික පුනරුදයේ පසුබිම

යුරෝපීයෝ ආසියාවේ යටත් කර ගත් ප්‍රදේශ පාලනය කිරීමේ දී තමන්ට පක්ෂපාති ජනතාවක් ඇති කර ගැනීම සඳහා ස්වකීය ආගම හා සංස්කෘතිය පතුරුවා හැරීමට කටයුතු කළහ. පෘතුගීසීන් හා ලන්දේසීන් මෙරට මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ සමයේ උඩරට ස්වාධීන රාජ්‍යයක් පැවති හෙයින් ආක්‍රමණිකයන්ගේ ආගමික හා සංස්කෘතික කටයුතු තම පාලන ප්‍රදේශවලට පමණක් සීමා විය. එහෙත් උඩරට රාජධානිය යටත් වීමෙන් පසුව බ්‍රිතාන්‍ය පාලනය යටතේ බටහිර සංස්කෘතිය රට පුරා පැතිර යාමට දොරටු විවර විය.

### මිෂනාරී සංවිධානවල කටයුතු

බ්‍රිතාන්‍ය පාලන සමයේ දී මෙරටට පැමිණි විදේශීය සංවිධාන කිහිපයක් කිතුණු දහම රට තුළ පැතිරවීමට ක්‍රියා කළේ ය. එම සංවිධාන මිෂනාරී සංවිධාන ලෙස හැඳින්වේ. ක්‍රිස්තු වර්ෂ 1804 - 1818 කාලයේ මෙරටට පැමිණි මිෂනාරි සංවිධාන කිහිපයක් පහත දැක්වේ.

| මිෂනාරි සංවිධාන | ශ්‍රී ලංකාවට පැමිණි වර්ෂය |
|---|---|
| ලන්ඩන් මිෂනාරි සමාගම | 1804 |
| බැප්ටිස්ට් මිෂනාරි සංවිධානය | 1812 |
| වෙස්ලියන් මිෂනාරි සංවිධානය | 1814 - 1815 |
| ඇමරිකන් මිෂනාරි සංවිධානය | 1816 |
| චර්ච් මිෂනාරි සංවිධානය | 1818 |

මෙම මිෂනාරි සංවිධානවල සාමාජිකයෝ ලංකාවේ විවිධ ප්‍රදේශවල ආගම පැතිරවීමේ කටයුතුවල නිරත වූහ. බැප්ටිස්ට්වරුන් කොළඹ මධ්‍යස්ථාන කොට ගෙන ක්‍රියාත්මක විය. වෙස්ලියන්වරු උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ක්‍රියාත්මක වූහ. ඇමරිකන් මිෂනාරි සංවිධානය යාපනය හා උතුරු ප්‍රදේශයේ තම කටයුතු මෙහෙයවිය. චර්ච් මිෂනාරිවරු කොළඹ, ගාල්ල, කල්පිටිය, මන්නාරම හා මහනුවර යන ප්‍රදේශවල තම කටයුතු මෙහෙයවූහ. මිෂනාරිවරු ලංකාවේ තම ආගම පැතිරවීමේ දී ලේඛනය, දේශනය හා අධ්‍යාපනය යන ක්ෂේත්‍ර තුනක් උපයෝගී කර ගත්හ.

## ලේඛන මාධ්‍ය යොදා ගැනීම

ලංකාවට පැමිණි මිෂනාරි සංවිධානවලට මුද්‍රණාල පිහිටුවීමට මෙන් ම පොත්පත් සඟරා ආදිය මුද්‍රණය කරවීමට අවශ්‍ය අරමුදල් සහ සංවිධාන ශක්තිය තිබුණි. තමන්ට ප්‍රධාන ගැටලුවක් වූ දේශීය භාෂා දැනුම ලබා ගැනීමට මිෂනාරි පූජකවරු සිංහල, දෙමළ වැනි භාෂා හැදෑරූහ. අනතුරුව බයිබලය සිංහලයට පරිවර්තනය කිරීමටත් සඟරා පුවත්පත් හා පොත් පත් මුද්‍රණය කොට බෙදා හැරීමටත් ඔවුහු කටයුතු කළහ. එසේ මුද්‍රණය කළ ප්‍රකාශන කිහිපයක් පහත දැක්වේ.

| මුද්‍රණය කළ වර්ෂය | ප්‍රකාශකගේ නම | මුද්‍රණය කළ සංවිධානය |
|---|---|---|
| 1832 | මාසික තෑග්ග | චර්ච් මිෂනාරි සංවිධානය |
| 1840 | ලංකා නිධානය | ආගමික පුස්තිකා සංගමය |
| 1842 | උරගල | බැප්ටිස්ට් සමාගම |

## දේශන මාධ්‍ය හා අධ්‍යාපනය

මිෂනාරි පූජකවරු පන්සල් හා මහජනතාව ගැවසෙන වෙනත් ස්ථානවල දේශන පවත්වා තම ආගමික ප්‍රචාරවල නිරත වූහ. එසේ ම පාසල් ආරම්භ කිරීම හා ඒවා පවත්වාගෙන යාමටත් ඔවුහු කැපවීමෙන් කටයුතු කළහ. මිෂනාරි අධ්‍යාපන කටයුතුවලට රජයේ අනුග්‍රහය ලැබුණි. බ්‍රිතාන්‍ය පාලන කාලයේ දී රජයේ තනතුරු ලබා ගැනීමට ඉංග්‍රීසි භාෂා දැනුම අවශ්‍ය විය. මේ නිසා සිංහල හා දෙමළ දරුවන්ට ඉංග්‍රීසි අධ්‍යාපනය ලැබීම සඳහා මිෂනාරි පාසල්වලට යාමට සිදුව තිබුණි.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## බෞද්ධ පුනරුද ව්‍යාපාරය

මිෂනාරීන් ලේඛන හා දේශන මාධ්‍යවලින් ප්‍රතිමා වන්දනාව නිසරු දෙයක් ලෙස ප්‍රචාරය කිරීමත්, බෞද්ධ හා හින්දු ඇතැම් සිරිත් විරිත් විවේචනය කිරීමත් නිසා ඒවාට පිළිතුරු දීමේ අවශ්‍යතාවක් පැන නැගුණි. එසේ ම සිංහල දෙමළ වැනි ස්වභාෂා අධ්‍යාපනයට රජයේ අනුග්‍රහයක් නො ලැබීම නිසා දේශීය භාෂා අධ්‍යාපනය නගා සිටුවීමේ අවශ්‍යතාවක් ද මතුව තිබුණි. මෙම ගැටලුවලට විසඳුම් සෙවීමේ දී බෞද්ධ භික්ෂූන් වහන්සේලා පුරෝගාමී ව කටයුතු කළහ. වලානේ සිද්ධාර්ථ හිමියන් රත්මලානේ පරම ධම්මචේතිය පිරිවෙන පිහිටුවීම බෞද්ධ අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැදගත් සිදුවීමකි. සිංහල, පාලි, සංස්කෘත වැනි භාෂා හැදෑරූ දේශීය සංස්කෘතිය අගය කරන ගිහි පැවිදි පඬිවරු පිරිසක් එම පිරිවෙනෙන් බිහි වූහ. එම පිරිසට අයත් හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියෝ වර්ෂ 1873 දී මාලිගා කන්දේ විද්‍යෝදය පිරිවෙන පිහිටුවූහ. රත්මලානේ ධම්මාලෝක හිමියන් විසින් වර්ෂ 1875 දී පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන පිහිටුවන ලදි. මෙසේ පැරණි පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය යළි ආරම්භ වීම නිසා තව තවත් උගතුන් බිහිවීම, බෞද්ධ පුනරුදයට ආශිර්වාදයක් විය.

### මුද්‍රණාල පිහිටුවීම

බෞද්ධයන්ට එතෙක් අඩුපාඩුවක් ව පැවති මුද්‍රණාලයක් පිහිටුවීමට බුලත්ගම ධම්මාලංකාර සිරි සුමනතිස්ස හිමියෝ කටයුතු කළහ. මේ සඳහා ලංකාවේ දනපතියන්ගෙන් ආධාර එකතු කොට එය ප්‍රමාණවත් නොවීම නිසා සියම් රටේ රජතුමාගෙන් ද ආධාර ලබා ගැනීමට සුමනතිස්ස හිමියන් කටයුතු කර ඇත. එකී සියලු මුදල් යොදවා වර්ෂ 1862 දී ගාල්ලේ **ලංකෝපකාර මුද්‍රණාලය** පිහිටුවීම බෞද්ධ පුනරුදයේ තවත් වැදගත් අවස්ථාවකි. මීට පසුව බෞද්ධයන් විසින් රටේ විවිධ ප්‍රදේශවල තවත් මුද්‍රණාල රැසක් පිහිටුවන ලදි. එබඳු මුද්‍රණාල කිහිපයක නම් පහත දැක්වේ.

බෞද්ධයන් පිහිටුවූ මුද්‍රණාල කිහිපයක්.

* ලංකාභිනව විශ්‍රැත මුද්‍රණාලය
* කවටකතික මුද්‍රණාලය
* සුදර්ශන මුද්‍රණාලය
* සරසවි සඳරැස මුද්‍රණාලය


1862 වර්ෂයෙන් පසුව මුද්‍රණාල රැසක් පිහිටුවීම නිසා සඟරා හා පුවත්පත් රාශියක් මුද්‍රණය කිරීමට බෞද්ධයන්ට හැකි විය.

බෞද්ධයන්ගේ එබඳු ප්‍රකාශන කිහිපයක් මෙසේ ය.

- ★ ලක්මිණි පහන
- ★ ලංකාලෝකය
- ★ සරසවි සඳරැස
- ★ සිංහල ජාතිය
- ★ සිංහල බෞද්ධයා

ප්‍රසිද්ධ වාද විවාද පැවැත්වීම

ආගම ප්‍රචාරය කිරීමට මිෂනාරීන් දේශන මාධ්‍ය යොදා ගත් අයුරින් ඊට පිළිතුරු වශයෙන් බෞද්ධයන් ද දේශන මාධ්‍ය යොදා ගත් ආකාරය ප්‍රසිද්ධ වාද විවාද මගින් පෙන්නුම් කෙරේ. මිෂනාරී පූජකතුමන්ලා සමග මෙම වාද විවාද පැවැත්වීමේ දී බෞද්ධ භික්ෂූන් වහන්සේලා පෙරමුණ ගත්හ. මෙහි දී මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් විශේෂයෙන් කැපී පෙනේ. කොටහේනේ දීපදුත්තාරාමයෙහි වැඩ වාසය කළ එම හිමියෝ බෞද්ධ පුනරුද ව්‍යාපාරයට විශාල සේවයක් සිදු කළහ. පූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ මූලිකත්වයෙන් ක්‍රිස්තියානි පක්ෂය සමඟ පැවැත්වූ වාද විවාදවල දී පූජ්‍ය හික්කඩුවේ සුමංගල හිමි, පූජ්‍ය වංකඩුවේ සුභූති හිමි, පූජ්‍ය පොතුවිල ඉන්ද්‍රජෝති හිමි, පූජ්‍ය රත්මලානේ ධම්මාලෝක හිමි වැනි උගත් හිමිවරුන්ගේ ද සහය ලැබුණි. එබඳු වාද පහක් **පංචමහා වාද** යනුවෙන් හැඳින්වේ.



පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි

**පංචමහා වාද**

| | |
|---|---|
| බද්දෙගම වාදය | 1865 |
| වරාගොඩ වාදය | 1865 |
| උදන්විට වාදය | 1866 |
| ගම්පොල වාදය | 1871 |
| පානදුරය වාදය | 1873 |

මෙම විවාද මාලාව අතුරින් පානදුරා වාදයට ජාත්‍යන්තර ප්‍රසිද්ධියක් ලැබුණි. එම වාදයේ දී බෞද්ධ පක්ෂය වෙනුවෙන් වාද කළ පූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් හා ක්‍රිස්තියානි පක්ෂය අතර ඇති වූ කතා ඇතුළත් පොතක් කියවීමෙන් පැහැදුණු හෙන්රි ස්ටීල් ඕල්කොට්තුමා පසුව ලංකාවට පැමිණියේ ය.



පූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## බෞද්ධ පාසල් පිහිටුවීම

1880 වර්ෂය පමණ වන විට බෞද්ධයෝ ලේඛන මාධ්‍ය හා දේශන මාධ්‍යයෙන් ඉදිරියට පැමිණ සිටි නමුත් මිෂනාරී අධ්‍යාපන ක්‍රමයට සරිලන ආකාරයේ බෞද්ධ පාසල් පද්ධතියක් පිහිටුවීමට අපොහොසත් වූහ. පාසල් පිහිටුවීමට හා පවත්වාගෙන යාමට අවශ්‍ය අරමුදල් නොමැතිවීම හා සංවිධාන ශක්තිය ප්‍රමාණවත් නොවීම ඊට හේතුව විය. මේ සඳහා දෙරටු විවර වූයේ ඕල්කොට්තුමා ලංකාවට පැමිණීමෙන් පසු ය. විදේශිකයෙකු වූ හෙන්රි ස්ටීල් ඕල්කොට්තුමා මෙරටට පැමිණ බුදු දහම වැළඳගෙන බෞද්ධ පාසල් පිහිටුවීමට පෙරමුණ ගෙන කටයුතු කළේ ය.

### හෙන්රි ස්ටීල් ඕල්කොට්තුමා


හෙන්රි ස්ටීල් ඕල්කොට්තුමා

ඕල්කොට්තුමාගේ මග පෙන්වීම යටතේ 1880 වර්ෂයේ ජුනි මස දී කොළඹ පරම විඥනාර්ථ සමාගම පිහිටුවිය. එය ගිහි පැවිදි දෙපක්ෂය එක ම වේදිකාවකට කැඳවන පොදු සංවිධානයක් විය. අනතුරු ව එහි ශාඛා ගාල්ල, නුවර, රත්නපුර වැනි ප්‍රධාන නගර කිහිපයක ම පිහිටුවිය. මෙම සංවිධානයේ ප්‍රධාන අරමුණක් වූයේ බෞද්ධ ශිෂ්‍යයන් සඳහා බෞද්ධ පාසල් පිහිටුවීම යි. ඒ සඳහා ඕල්කොට්තුමාගේ මග පෙන්වීමෙන් බෞද්ධ පාසල් අරමුදලක් පිහිටුවන ලදි. මෙම අරමුදලට ආධාර එකතු කිරීමට ඕල්කොට්තුමා භික්ෂූන් වහන්සේලා සමග ගමින් ගම සංචාරය කිරීම නිසා පාසල් පිහිටුවීම පිළිබඳ බෞද්ධයන් තුළ බලවත් උනන්දුවක් ඇති විය. බෞද්ධ පාසල් පිහිටුවීමේ ව්‍යාපාරයේ දී පෙරමුණ ගෙන ක්‍රියා කළ ගිහි පැවිදි පිරිසෙන් කිහිප දෙනෙකුගේ නම් පහත දැක්වේ.

බෞද්ධ පාසල් පිහිටුවීමට ක්‍රියාකාරී වූ පිරිස,

- *හෙන්රි ස්ටීල් ඕල්කොට්තුමා*
- *පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි*
- *පූජ්‍ය රත්මලානේ ශ්‍රී ධම්මාලෝක හිමි*
- *පූජ්‍ය වස්කඩුවේ ශ්‍රී සුභූති හිමි*
- *පූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි*
- *දොන් කරෝලිස් හේවාවිතාරණ මහතා*
- *අමාරිස් ද සිල්වා බටුවන්තුඩාවේ මහතා*
- *දොන් ස්පෙටර් සේනානායක මහතා*
- *අනගාරික ධර්මපාල තුමා*
- *ජෙරමියෙස් දියෙස් මහතා*

බෞද්ධ පාසල් පිහිටුවීමේ දී ඉහත සඳහන් ඇතැම් දෙනා මුදලින් ඊට ආධාර උපකාර කළහ. මෙසේ කැපවීමෙන් ක්‍රියා කිරීම නිසා ලංකාවේ ප්‍රධාන නගර කිහිපයක ම බෞද්ධ පාසල් පිහිටුවීමට හැකියාව ලැබුණි. එසේ පිහිටුවූ පාසල් කිහිපයක නම් පහත දැක්වේ.

කොළඹ ආනන්ද විද්‍යාලය

මහනුවර ධර්මරාජ විද්‍යාලය

ගාල්ලේ මහින්ද විද්‍යාලය

මාතලේ විජය විද්‍යාලය

ගම්පොළ ජිනරාජ විද්‍යාලය

නාවලපිටියේ අනුරුද්ධ විද්‍යාලය

බෞද්ධ පුනරුද ව්‍යාපාරය නිසා මුද්‍රිත මාධ්‍ය ක්ෂේත්‍රයේ දියුණුවක් ඇති වූ අතර විවිධ පොත් පත්, සඟරා හා පුවත් පත් කියවීම නිසා රටේ ජනතාවගේ බුද්ධි වර්ධනයක් ඇති විය. අධ්‍යාපන ප්‍රබෝධය නිසා ජනතාවගේ සාක්ෂරතාව ඉහළ ගියේ ය. ඉංග්‍රීසි අධ්‍යාපනය වැඩි දියුණු කිරීමට මිෂනාරී සංවිධානවලින් ද විශාල සේවයක් සිදු විය. ඕල්කොට්තුමාගේ මැදිහත්වීම මත රජය ලවා වෙසක් පොහොය දිනය නිවාඩු දිනයක් බවට පත් කර ගැනීමට හැකි වීමත් අද පවා භාවිත වන බෞද්ධ කොඩිය නිර්මාණය කර ගැනීමත් බෞද්ධ පුනරුද සමයේ සිදු වූ තවත් වැදගත් කරුණකි.



වලිසිංහ හරිශ්චන්ද්‍ර මහතා

පිරිවෙන් හා බෞද්ධ පාසල් ආරම්භ වීම නිසා දේශීය සංස්කෘතිය අගය කරන සමය මාමක තරුණ පරම්පරාවක් බිහි විය. එම තරුණ පිරිස අතර දේශීය සංස්කෘතියේ උසස්කම හුවා දැක්වූ නව සමාජ සුධාරකයන් පිරිසක් හා ජාතික ලේඛක පරපුරක් දක්නට ලැබුණි. මේ පිරිසට අයත් අනගාරික ධර්මපාලතුමා, වලිසිංහ හරිශ්චන්ද්‍රතුමා, පියදාස සිරිසේන මහතා, සහ ජෝන් ද සිල්වා වැනි නායකයෝ විවිධ මාධ්‍ය ප්‍රයෝජනයට ගනිමින් දේශීය ජනතාව තුළ දේශානුරාගය හා ජාත්‍යාලය වර්ධනය කිරීමට ක්‍රියා කළහ. එම නිසා 20 වන සියවස ඇරඹෙන විට බෞද්ධ පුනරුද ව්‍යාපාරය තුළින් ස්වදේශිකයන් තුළ දේශානුරාගය දැනවීමේ ව්‍යාපාරයක්, බෞද්ධ පූජනීය ස්ථාන රැක ගැනීමේ ව්‍යාපාරයක් හා අමද්‍යප ව්‍යාපාරයක් ඇරඹිණි.

## දේශානුරාගය හා ජාත්‍යාලය වර්ධනය කිරීමේ ව්‍යාපාරය


බ්‍රිතාන්‍ය පාලන සමයේ රට තුළ බටහිර සංස්කෘතිය වේගයෙන් ව්‍යාප්ත වීම නිසා බටහිර සිරිත් විරිත් අනුකරණය කිරීම පැතිර ගිය අතර ඒ වෙනුවට දේශීය සංස්කෘතිය අගය කිරීමට ජනතාව උනන්දු කරවීමෙන් රටට ආදරය කරන ජනතාවක් බිහි කිරීම, මෙම



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ව්‍යාපාරයේ අරමුණ විය.

අනගාරික ධර්මපාලතුමා මෙරට අතීත ශිෂ්ටාචාරයේ වැදගත්කම හා බෞද්ධ සහජීවනයේ වටිනාකම පැහැදිලි කරමින් නව චින්තනයක් ඉදිරිපත් කළේ ය. එතුමා ප්‍රසිද්ධ දේශන පවත්වමින් ද **සිංහල බෞද්ධයා, හා මහාබෝධි සඟරාව** වැනි ප්‍රකාශනවලට ලිපි සපයමින් ද මේ සඳහා ක්‍රියාත්මක විය.



අගාරික ධර්මපාලතුමා

පියදස සිරිසේන මහතා තම නවකතා මඟින් ද **සිංහල ජාතිය** වැනි පුවත්පත් ඔස්සේ ද ලාංකිකයන් විචාරයකින් තොරව බටහිර සංස්කෘතිය වැළඳ ගැනීම විවේචනය කළේ ය. මීට අමතරව බෞද්ධ භික්ෂූන් වහන්සේලා හා ගිහි උගත්තු රැසක් ද දේශීය සංස්කෘතියේ අගය මතු කරමින් ජනතාව දැනුම්වත් කිරීමට කටයුතු කළහ.

## බෞද්ධ පූජනීය ස්ථාන රැක ගැනීමේ කටයුතු

රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසුව අනුරාධපුරය, පොළොන්නරුව වැනි පැරණි අගනුවරවල් ආශ්‍රිත බෞද්ධ ස්මාරක වල් බිහි වී විනාශ වෙමින් පැවති අතර 19 සියවස අග භාගය වන විට ඒවා ප්‍රතිසංස්කරණය කොට අතීත උරුමයන් රැක ගැනීම ගැන ජනතාව තුළ උනන්දුවක් ඇති විය. යුරෝපීය උගතුන් වූ ජෝර්ජ් ටර්නර්, රිස් ඩේවිඩ්, එච්. සී. පී. බෙල්, හෙන්රි පාකර් ආදීන් ඓතිහාසික මූලාශ්‍රය සොයා එළි දක්වමින් පුරාවිද්‍යා ගවේෂණ, කැණීම්, හා පර්යේෂණ මගින් පැරණි සංස්කෘතියේ ඇතැම් අංග මතු කිරීමත්, ඔවුන් ලියූ පොත පතට පරිවාර වශයෙන් දේශීය උගතුන් පොත පත ලීවීමත් නිසා පැරණි ශිෂ්ටාචාරය හා ඓතිහාසික උරුමයන් පිළිබඳ පොදු ජන අවබෝධය පුළුල් විය. මෙම පරිසරය තුළ වලිසිංහ හරිස්චන්ද්‍රතුමා බොහෝ කැප කිරීම් කරමින් අනුරාධපුරයේ පූජනීය ස්ථාන ආරක්ෂා කර ගැනීමේ ව්‍යාපාරයක් ආරම්භ කළේ ය. අනගාරික ධර්මපාලතුමා බුද්ධගයාව වැනි ඉන්දියාවේ පූජනීය ස්ථාන රැක ගැනීමට ඉදිරිපත් විය.

**ක්‍රියාකාරකම**

ලංකාවේ බෞද්ධ පුනරුද ව්‍යාපාරයක් ආරම්භ වූ ආකාරය පිළිබඳ ව පහත කරුණු ඇසුරින් ලිපියක් සකස් කරන්න.

මුද්‍රණාල පිහිටු වීම, වාදවිවාද පැවැත්වීම, බෞද්ධ පාසැල් පිහිටුවීම, දේශානුරාගය හා ජාත්‍යාලය වර්ධනය කිරීමේ ව්‍යාපාරය, බෞද්ධ පූජනීය ස්ථාන රැක ගැනීම.

### අමද්‍යප ව්‍යාපාරය

බ්‍රිතාන්‍ය පාලනය යටතේ දිවයිනේ මත්පැන් පානය පැතිර යාම නිසා සමාජ ගැටලුවක් නිර්මාණය වෙමින් තිබුණි. මේ නිසා බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ නායකයෝ මත්පැන් පානයට එරෙහිව ජනතාව දැනුම්වත් කළහ. බෞද්ධ භික්ෂූන් වහන්සේලා මෙහි දී ද කැපී පෙනෙන සේවයක් සිදු කළ අතර අනගාරික ධර්මපාලතුමා පියදාස සිරිසේන මහතා සහ ජෝන් දසිල්වා මහතා වැනි අය විවිධ මාධ්‍ය මගින් ජනතාව දැනුම්වත් කිරීමට ඉදිරිපත් වූහ. ධර්මපාල තුමා ප්‍රසිද්ධ දේශන හා පුවත්පත් මාර්ගයෙන් මෙම කටයුතුවල නිරත විය. පියදාස සිරිසේන මහතා තම නවකතාවල විවිධ චරිත සංවාදයට ලක් කොට මත්පැන් පානයේ අනිසි විපාක පැහැදිලි කළේ ය. ජෝන් ද සිල්වා මහතා තම නාට්‍ය මගින් මත්පැන් පානයෙන් සිදු වන විපත පැහැදිලි කළේ ය. එතුමා රචනා කළ සිංහල පරාභව නාට්‍යයේ සුරා කාණ්ඩය තුළින් මත්පැන් පානයේ අයහපත පෙන්වී ය.

## හින්දු ආගමික පුනරුදය

මිෂනාරී සංවිධානවල ආගමික ප්‍රචාරක කටයුතුවලින් එල්ල වූ අභියෝග නිසා මෙරට හින්දු ජනතාව අතර ද ආගමික හා සංස්කෘතික පිබිදීමක් ඇති විය. එකී හින්දු පුනරුද ව්‍යාපාරයට නායකත්වය සපයන ලද්දේ ආරුමුග නාවලර්තුමා විසිනි. මිෂනාරී පාසලක එතුමා මූලික අධ්‍යාපනය ලබා තිබීමත් මෙතෝදිස්ත සභාවේ දේවගැතිවරයෙකු යටතේ සේවය කර තිබීමත් නිසා මිෂනාරී කටයුතු ගැන එතුමාට හොඳ අවබෝධයක් තිබුණි. මේ නිසා මුද්‍රණාල පිහිටුවීම, මුද්‍රිත පත්‍රිකා, පොත් පත් හා ප්‍රසිද්ධ දේශන මගින් හින්දු ජනතාව දැනුම්වත් කිරීම සහ හින්දු ජනතාව වෙනුවෙන් පාසල් පිහිටුවීමට එතුමා කටයුතු කර ඇත.

### ආරුමුග නාවලර්තුමා

නාවලර්තුමාගේ මගපෙන්වීම යටතේ යාපනයේ වන්නපොනෙයි ප්‍රදේශයේ මුද්‍රණාලයක් ඇරඹූ අතර ලේඛන මාධ්‍යයෙන් ජනතාව දැනුම්වත් කිරීමට එමගින් පියවර ගැණුණි. 'උදයභානු' යනුවෙන් පුවත්පතක් ආරම්භ කිරීමට ද එතුමා කටයුතු කළේ ය. දෙමළ සිසුන් සඳහා කාණ්ඩ තුනකින් යුතු පෙළපොතක් රචනා කිරීම එතුමාගේ තවත් විශිෂ්ට සේවයකි. එසේ ම ගද්‍ය පද්‍ය පොත් කිහිපයක් පරිවර්තනය කොට ප්‍රකාශයට පත් කෙරිණි. පෙරිය පුරාණම් හා ස්කන්ද පුරාණම් යන ග්‍රන්ථ එයට උදාහරණයකි.



ආරුමුග නාවලර්තුමා



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

දෙමළ සිසුන්ට හින්දු සංස්කෘතියට ගැළපෙන අධ්‍යාපනයක් ලබා දීම සඳහා නාවලර්තුමාගේ පුරෝගාමීත්වයෙන් 1849 වර්ෂයේ දී වන්නපොනෙයි ශෛව ප්‍රකාශ විද්‍යාලය පිහිටුවී ය. පසුව ආරම්භ කළ ශෛව පරිපාලන සභාව සහ හින්දු අධ්‍යාපන සභාව මගින් හින්දු පාසල් පිහිටුවීමේ ව්‍යාපාරය තවදුරටත් ක්‍රියාත්මක කළේ ය. දෙමළ සිසුන් අතර ඉංග්‍රීසි අධ්‍යාපනය ප්‍රචලිත කිරීමට 1872 වර්ෂයේ දී යාපනයේ ශිවන්ගල විද්‍යාලය ආරම්භ කළ අතර පසුව එය යාපන හින්දු විද්‍යාලය බවට පත් විය.


පොන්නම්බලම් රාමනාදන්



පොන්නම්බලම් අරුණාචලම්

ආරුමුග නාවලර් තුමාගේ අභාවයෙන් පසුව ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් හා පොන්නම්බලම් අරුණාචලම් යන නායකයෝ හින්දු පුනරුද ව්‍යාපාර තවදුරටත් මෙහෙය වීමට කැපවීමෙන් කටයුතු කළහ. මෙම නායකයන් දෙදෙනා මෙරට දෙමළ ජනතාව අතර පමණක් නොව සිංහල ජනතාවගේ ද මහත් ගෞරවයට පත් වූ අය වේ. 1915 වර්ෂයේ දී ආණ්ඩුව යුද්ධ නීතිය පනවා බෞද්ධයන්ට එරෙහිව දැඩි මර්දනයක් දියත් කළ අවස්ථාවේ පොන්නම්බලම් රාමනාදන් මහතා බෞද්ධයන් වෙනුවෙන් හඬ නැගී ය. පොන්නම්බලම් අරුණාචලම් මහතා සිංහල නායකයන් සමග එකතු වී දේශපාලන බලතල ලාංකිකයන්ට ලබා ගැනීම පිණිස කටයුතු කිරීම සඳහා 1919 වර්ෂයේ දී ලංකා ජාතික සංගමය පිහිටුවීමට මූලිකත්වය ගෙන කටයුතු කළේ ය.

## ඉස්ලාම් ආගමික පුනරුදය

බෞද්ධ හා හින්දු පුනරුදයට සමගාමීව මෙරට මුස්ලිම් ජනතාව තුළ ද ආගමික හා සංස්කෘතික ප්‍රබෝධයක් ඇති විය. ආරුමුග නවලර්තුමා හින්දු පුනරුද ව්‍යාපාරයට නායකත්වය ලබා දුන්නා සේ ම ඇම්. සී. සිද්දිලෙබ්බෙ මහතා මුස්ලිම් ජනතාව තුළ ඉස්ලාම් ආගමික හා සංස්කෘතික ප්‍රබෝධයක් ඇති කිරීමට නායකත්වය ලබා දුන්නේ ය. 1883 වර්ෂයේ දී ඊජිප්තුවේ සිට ලංකාවට පැමිණි ඉස්ලාම් භක්තිකයෙකු වූ අරාබි භාෂා ඉස්ලාම් පුනරුද ව්‍යාපාරයේ කටයුතු සාර්ථක කර ගැනීමට කැප වී කටයුතු කළේ ය.

**සිද්දිලෙබ්බෙ මහතා**


සිද්ධි ලෙබ්බෙ

මුස්ලිම් ජනතාව තුළ අධ්‍යාපන ප්‍රබෝධයක් ඇති කිරීමත් ඉංග්‍රීසි භාෂාව හා අරාබි භාෂාව ඉගෙන ගැනීමට එම ජනතාව උනන්දු කරවීමත් සිද්දිලෙබ්බෙ මහතාගේ මූලික අරමුණක් විය. එතුමාගේ මග පෙන්වීම යටතේ 1882 වර්ෂයේ දී මුස්ලිම් **නෙයිසන්** නමින් පුවත් පතක් ආරම්භ කෙරුණි. අනතුරුව සිද්දිලෙබ්බෙ මහතාගේ මගපෙන්වීම මත මුස්ලිම් ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් කොළඹ සහිරා විද්‍යාලය පිහිටුවිය. මුස්ලිම් ජනතාවගේ අධ්‍යාපන කටයුතු ඉදිරියට ගෙන යාම සඳහා මුස්ලිම් අධ්‍යාපන සමිතිය නම් සංවිධානයක් පිහිටුවන ලදි. අලුතෙන් ඇති වූ අධ්‍යාපන අවශ්‍යතා නිසා 'මද්රාසා' නම් මුස්ලිම් ආගමික පාසල් ප්‍රතිසංවිධානය කෙරුණි.


ටී.බී. ජයා මහතා

සිද්දිලෙබ්බෙ මහතාට පසුව ටී. බී. ජයා මහතා මුස්ලිම් ජනතාවගේ අධ්‍යාපන ප්‍රබෝධය ඉදිරියට මෙහෙයවීමට කැප විය. එතුමා කොළඹ සහිරා විද්‍යාලයේ විදුහල්පති වශයෙන් පත්ව එම පාසල දියුණු කළේ ය. ලංකාවේ ප්‍රදේශ කිහිපයක ම මුස්ලිම් ජනතාව වෙනුවෙන් පාසල් පිහිටුවීමට ජයා මහතා මූලිකත්වය ගෙන කටයුතු කළ අතර දේශපාලනඥයකු වශයෙන් ද හෙතෙම විශාල සේවයක් සිදු කළේ ය.

**ක්‍රියාකාරකම**

පහත සඳහන් මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

බෞද්ධ, හින්දු හා ඉස්ලාම් පුනරුද ව්‍යාපාරයේ ප්‍රධාන නායකයින් පිළිබඳ තොරතුරු ගොනුවක් සකස් කරන්න.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.